# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2273/82 - 2022 අප්‍රේල් මස 01 වැනි සිකුරාදා - 2022.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය

2011 අංක 02 දරන සංශෝධන ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියේ 61 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ,**
ආණ්ඩුකාරවර,
වයඹ පළාත.

2022 මාර්තු මස 15 වැනි දින,
කුරුණෑගල දී ය.

**නියෝග**

2010 දෙසැම්බර් මස 21 වැනි දින අංක 1685/11 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2010 අංක 1 දරන පළාත් පාරිසරික (ආරක්ෂණ හා තත්ත්ව) නියෝගය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1. එහි 6 වන නියෝගයේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්,

   "(ආ) ප්‍රඥප්තියේ 21(2) වන වගන්තිය යටතේ අත්හිටුවීමකට හෝ අවලංගු කිරීමකට යටත්ව අවුරුදු තුනක කාලයකට වැඩි නොවන පරිදි බලපත්‍රයේ නිශ්චිතව සඳහන් යම් කාලයක් සඳහා වලංගු විය යුතුය."

2. එහි II වන උපලේඛනයේ "ආ" ආකෘති පත්‍රයේ පොදු නියම හා කොන්දේසිවල 1 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

   "1. බලපත්‍රය, ඒ බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා වලංගු විය යුතුය. ඒ කාලසීමාව බලපත්‍රය



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නිකුත් කරන ලද දිනයේ සිට අවුරුදු තුනකට වැඩි නොවිය යුතුය. බලපත්‍රයේ වලංගු කාලය අවසන් වීමට මසකට පළමු බලපත්‍රය අළුත් කිරීම සඳහා ඉල්ලුම් කළ යුතුය."

EOG 04 - 0007/1

---

**වයඹ පළාතේ පළාත් සභාව**

1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය

2011 අංක 02 දරන සංශෝධන ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියේ 61 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ,**
ආණ්ඩුකාරවර,
වයඹ පළාත.

2022 මාර්තු මස 15 වැනි දින,
කුරුණෑගල දී ය.

**නියෝග**

1998 මාර්තු මස 27 වැනි දින අංක 1020/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ව්‍යාපෘති අනුමත කිරීමේ නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1. එහි 4 වන නියෝගයේ (iii) වන ඡේදය ඉවත් කිරීමෙන්,

2. එහි 9 වන නියෝගයේ (i) වන ඡේදය, (ii) වන ඡේදය හා (iii) වන ඡේදය ඉවත් කිරීමෙන්,

3. එහි 10 වන නියෝගය වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් ;

"10. මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාව ලැබීමෙන් පසු, ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන විසින් දින 21 ක කාලයක් ඇතුළත -

(i) නිශ්චිතව දක්වනු ලබන කොන්දේසිවලට යටත්ව, යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය දෙනු ලැබිය යුතුය; නැතහොත්

(ii) පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාවක් ඉදිරිපත් කිරීමට ව්‍යාපෘති යෝජකගෙන් ඉල්ලීමක් කරනු ලැබිය යුතුය; නැතහොත්

(iii) ප්‍රතික්ෂේප කිරීමට තුඩුදුන් හේතු සඳහන් කරමින් යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය දීම ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතුය".

EOG 04 - 0007/2

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.